**වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව - 2021**
**-----------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**--------------------------**

වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
**----------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැඩ, පරිත්‍යාග භාණ්ඩ සහ මිලදී ගන්නා ලද පරිගණක සහ පොත්පත්වල වටිනාකම රු. 4,669,458 ක් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම අඩුවෙන් දක්වා තිබුණි. | වැරදීමකින් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට නොහැකි විය. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ව්‍යාපෘති 08 ක රු. 6,290,000 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීම සහ රු. 18,190,829 ක් වටිනා ක්‍රියාත්මක නොකරන ලද ව්‍යාපෘති 20 ක් සඳහා ගෙවීම් වවුචර් පිළියෙල කර විවිධ ණය හිමියන් යටතේ වියදම් සහ ජංගම වගකීම් රු. 24,480,829 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සභාවේ ආදායම් වර්ෂ අවසානයේදී ද ලැබෙන බැවින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂය අවසානය දක්වා ප්‍රමාද කිරීමට සිදුවී ඇත. අදාල වර්ෂයේ විවිධ ණය හිමියන් යටතේ ගිණුම්ගත කිරීමට සිදුවේ. | සිදු නොවූ ගණුදෙනු වල වටිනාකම් ගිණුම්ගත නොකල යුතුය. |
| (ඇ) | 1987 හි අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ XXX පරිච්ඡේදය අනුව සහ බලප්‍රදේශයේ ප්‍රදර්ශන කර තිබු දැන්වීම් පුවරුවලින් බලපත්‍ර ගාස්තු අයකළ යුතුවූවද, මානිප්පායි උප කාර්යාල බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ රු. 87,650 කින් ආදායම් අතිරික්තය සහ ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | මානිප්පායි උප කාර්යාල බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම් සම්බන්ධයෙන් කීප වතාවක් ලිපි මගින් දැනුවත් කර ඇත. | අදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කඩිනම් කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු ඉඩම් කැබැලි 05 ක, වාහන 14 ක, ජල මොටර් 02 කෙසහ පුස්තකාල පොත් 456 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ජංගම වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම අඩුවෙන් දක්වා තිබුණි. | සභාව සතු ඉඩම් සඳහා අදාළ ලියවිලි නොතිබීම, වාහනවල වටිනාකම තක්සේරුකර නොතිබීම නිසා වත්කම් ලෙස දක්වා නොතිබුණි. ජල මෝටරය අතපසුවීමකින් ස්ථාවර වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සංවර්ධන ප්‍රතිපාදන යටතේ | 25,801,558 | ප්‍රාග්ධන සංවර්ධන වැඩ සම්බන්ධ විස්තර | 2021 වර්ෂයේ සංවර්ධන ප්‍රතිපාදන රු. මිලියන 37.2 කින් පරිගණක මිලදී ගැනීම සඳහා රු. 2,383,500 ක් | ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වැයකර ඇත. ඉතිරි ප්‍රතිපාදනයට අදාල ව්‍යාපෘති ආරම්භ කර ඇත. | |
| (ආ) | වරිපනම් බදු ආරම්භක ශේෂය | 25,498,555 | කාල විශ්ලේෂණය | ඉදිරියේදි හිඟ වරිපනම් බදු සඳහා කාල විශ්ලේෂනයන් මුල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | කාල විශ්ලේෂණ අයකිරීමට කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.54,400,837 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.42,348,978 ක් විය.

**2.2** **ආදායම් පරිපාලන**

--------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ----------- |
| (අ) | **වරිපනම්** ---------- | | |
| | සමාලෝචිත වර්ෂයේ ලැයිස්තුගත වරිපනම් බදු රු. 7,818,832 ක් වුවද, ඉන් රු. 5,517,100 ක් රැස්කරගෙන නොතිබුණි. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය අනුව සභා බලප්‍රදේශයේ තිබෙන ඉඩම්, ඉදි කරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා අයකළ යුතු රු. 22,083,894 ක වරිපනම් බදු වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුනද, හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණ විය. | අවතැන්වූ දේපළ අයිතිකරුවන්, ගමන් සීමාකිරීම් හේතුවෙන් ලැයිස්තුගත වරිපනම් බදු අයකර ගැනීමට නොහැකිව ඇත. උප කාර්යාලවල වැඩි වටිනාකමක් ඇති හිඟ මුදල් සඳහා රතු නිවේදන නිකුත්කර සමාලෝචිත වර්ෂයේදි හිඟ මුදලින් රු. 4,943,129 ක් අයකර ගෙන ඇත. | ආදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **බදු කුලි** -------- | | |
| | සමාලෝචිත වර්ෂ අවසානයට වර්ෂ 02 ක් ඉක්මවූ රු. 550,424 ක් වටිනා බදු කුලි හිඟයක් පැවතුනි. | කාක්කතිවු මාළු වෙළඳපොල බදු මුදල් ගෙවීම් පැහැර හැරීමට විරුද්ධව නඩු පවරා තීන්දු ලබා දී තිබුණද, හිඟ මුදල ගෙවා නොතිබුණි. තැවත නඩු පවරා හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාල ශේෂය සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව විසින් දීර්ඝ කාලීන බදු දීමට තිබූ කඩ කාමර 11 ක් සහ පොළ කඩ කාමර 4 ක් බදු දීමට කටයුතු කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ රු. 1,365,484 ක ආදායමක් අහිමිවී තිබුණි. | මානිප්පායි වෙළඳ සංකීර්ණයේ උඩ මහලේ කඩ කාමර බදු දීම සඳහා 2022.02.17 දින ටෙන්ඩර් කැඳවන ලදි. නමුත් කඩ කාමර ලබා ගැනීම සඳහා කිසිවෙකු ඉදිරිපත්වී නොමැති බැවින් බදු දී නොතිබුණි. නැවතත් ටෙන්ඩර් කැඳවීම සඳහා සභා තීරණය ගෙන ඇත. ඒ අනුව කටයුතු කරනු ලැබේ. අදාල පොළවල් 04 සඳහා නැවත ටෙන්ඩර් කැඳවා තිබුණද, කිසිවෙකු ඉදිරිපත් වී නොමැත. එසේ හෙයින්, නැවත ටෙන්ඩර් කැඳවූවද බදු දීමට නොහැකි විය. | සභාවේ අදායම් මාර්ග සම්පූර්ණයෙන් ආදායම් ඉපයීම සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල තැන්පත් කර තිබූ රු. 187,094,067 ක මුදල යොදවා සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකර පොලී ආදායම් ඉපයීම සඳහා බැංකුවේ තැන්පත් කර තිබුණි. | රු. 187,094,067 ක් සභාවේ ස්ථාවර තැන්පත්වලින් 2022 අප්‍රේල් මාසය දක්වා සංවර්ධන ප්‍රතිපාදන රු. 25,315,104 ක යොදවා සංවර්ධන වැඩ ක්‍රියාත්මක කර අතර, ඉදිරියේදීද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. | සභා අරමුදල අරපිරිමැස්මෙන් උපරිම මට්ටමින් සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීම සනාථ කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් යොදවා ඉදිකරන ලද මාසියපිටි ජනශක්ති මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශක 2006 හි 2.3.1 (අ) අනුව අවශ්‍ය අනුමැතීන් ලබා නොතිබීම හේතුවෙන් කඩා දමා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව මෙම වැඩ සඳහා වැය කරන ලද රු. 74,782 ක මුදල නිෂ්ඵල වියදමක් වී ඇත. | මෙම පැති බැම්ම කඩා දැමීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස යාපනය මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුවරයා වෙත දැනුම් දී ඇත. | ඉදිකිරීම් කිරීමට පෙර අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතුය. |